# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

**මුදල් අමාත්‍යාංශය**

**සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන**

**රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාතතාංශය**

**நிதி அமைச்சு**

**சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும்**

**கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு**

Ministry of Finance

**State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business Development and Underutilized State Resources Development**


| | | |
|---|---|---|
| මගේ අංකය / **எனது இல** / My No: DSD/HO/04/ER/09- 2020- ගෘහ ආර්ථික | ඔබේ අංකය / **உமது இல** / Your No: ........................ | දිනය / **திகதி** / Date: 2020.10.21 |

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ,
සමෘද්ධි කළමණාකරු,
සමෘද්ධි සංවර්ධන නිලධාරී,
කොළඹ, කළුතර, ගම්පහ,ගාල්ල,මාතර,රත්නපුර,
කෑගල්ල,මහනුවර,මාතලේ,බදුල්ල, කුරුණෑගල.

**<u>ගෘහ ආර්ථිකය පෝෂණය වැඩිදියුණු කර පවුල් ඒකක සවිබලගැන්වීමේ</u>**

**<u>ජාතික ගෙවතු වගා වැඩසටහන - 2020/21 මහ කන්නය</u>**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය, හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ 2020.10.20 දින උක්ත වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවට අනුව පහත සඳහන් උපදෙස් ඔබ වෙත ලබාදීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.

02.ඔබ දිස්ත්‍රික්කයේ හඳුනාගත් ගෘහ ආර්ථික ඒකක වෙත ලබාදීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් මධ්‍යස්ථාන කිපයක බීජ ඇසුරුම් කිරීමේ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී. ඇමුණුම 1 හි සඳහන් පරිදි ඇසුරුම් කරන ලද බීජ පැකට් ඔබ දිස්ත්‍රික් කාර්යාලය වෙත ලබාදීමට කටයුතු කරන අතර ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාවට අනුපාත වන අයුරින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා බීජ පැකට් ලබාදිය යුතුවේ. එමෙන්ම සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් විසින් හඳුනාගත් ගෘහ ඒකක සඳහා එම නිලධාරීන් දෙදෙනාගේ එකඟතාවය මත, ප්‍රමුඛතා පදනමින් ලැබෙන් බීජ පැකට් ප්‍රමාණය බෙදාදිය යුතු වේ. බීජ පැකට් ලබාදීම සඳහා ප්‍රමුඛතා පදනමින් ගෘහ ඒකක හඳුනාගන්නා ලෙසත් උපදෙස් ලැබුණු පසු බීජ පැකට් ගෘහ ඒකක වෙත ලබාදෙන ලෙසත් නිලධාරීන් දැනුවත් කිරීම අවශ්‍ය වේ.

03. මේ හා සමාන බීජ පැකට් ප්‍රමාණයක් ඉදිරියේදී ආර්ථික සංවර්ධන නිලධාරී සහ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් වෙත ද ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මඟින් ලබාදීමට නියමිතය.




**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaram**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28** |

04. ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් මේ වන විට ක්‍රියාත්මක පැල තවාන් මගින් ග්‍රාමීය කමිටුවේ එකඟතාවය මත හඳුනාගත් ගෘහ ඒකක වෙත තවාන් පැල 12 බැගින් ලබාදිය යුතු අතර ඒවා ලබාදිය යුතු දිනය ජනාධිපති කාර්යසාධන බලකාය විසින් හැකි ඉක්මණින් දන්වනු ඇත.

05. හොඳින් වර්ධනය වූ නිරෝගී පැලයක් සඳහා පොලිතීන් වෙනුවෙන් වැය වූ මුදල ද ඇතුලත්ව රු. 4.50 ක මුදලක් පැල තවාන් හිමියන්ට ගෙවීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. මේ සඳහා ග්‍රාමීය කමිටුවේ සියළු නිලධාරීන් විසින් සහතික කරන ලද පැල ලබාදුන් ගෘහ ඒකක හිමියන්ගේ නම ලිපිනය හා අත්සන සහිත ලේඛණය කලාප කළමණාකරු වෙත භාරදිය යුතු අතර එහි පිටපතක් වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරියා සතුව තබාගත යුතු වේ. අනතුරුව කලාප කළමණාකරුවන් විසින් තම නිර්දේශය සමඟ අදාල ලේඛණ මුලස්ථාන කළමණාකරු වෙත ලබාදිය යුතුය. මෙම ලේඛණයන්ට අනුව ඇමුණුම් 02 හි සඳහන් ආකාරයට ඔබ දිස්ත්‍රික්කයේ බෙදා දුන් පැල සංඛ්‍යාව පිළිබඳව තොරතුරු දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් සහතික කර ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන අංශය වෙත ලබාදෙන මෙන් වැඩිදුරටත් දන්වමි.

මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබ ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහාය ඉතා අගය කොට සලකමි.

ඒ.ජී. වෙල්ලප්පිලි
අධ්‍යක්ෂ (ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන)

අත්.කළේ:- ආර්.පී.බී තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. ලේකම් - ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව පිටුදැකීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකාය - කා.දැ.ගැ.පි.
2. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
3. රාජ්‍ය ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
4. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
5. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
6. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.

## ගෘහ ආර්ථිකය පෝෂණය වැඩිදියුණු කර පවුල් ඒකක සවිබලගැන්වීමේ ජාතික ගෙවතු වගා වැඩසටහන 2020/21 මහ කන්නය

## දිවයිනේ තෙත් හා අතරමැදි කලාපයට අයත් දිස්ත්‍රික්ක වල එළවළු බීජ පැකට් බෙදාහැරීම

## සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | ප්‍රජාමුල බැංකු සංගම් ගණන | ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ලබාදිය හැකි බීජ පැකට් ප්‍රමාණය සීමාසහිත හෙයින් සමෘද්ධි සංවර්ධන නිලධාරී හා ග්‍රාම නිලධාරී වෙත ලබාදිය යුතු බීජ පැකට් සඳහා එවීමට හැකි බීජ පැකට් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 13 | 42 | 557 | 15,462 |
| 2 | ගම්පහ | 13 | 86 | 1,177 | 32,689 |
| 3 | කළුතර | 14 | 56 | 762 | 21,153 |
| 4 | ගාල්ල | 19 | 68 | 895 | 24,845 |
| 5 | මාතර | 16 | 50 | 650 | 18,044 |
| 6 | මහනුවර | 20 | 91 | 1,187 | 32,951 |
| 7 | මාතලේ | 11 | 40 | 545 | 15,129 |
| 8 | කුරුණෑගල | 30 | 120 | 1,610 | 44,694 |
| 9 | බදුල්ල | 15 | 44 | 567 | 15,740 |
| 10 | කෑගල්ල | 11 | 44 | 573 | 15,906 |
| 11 | රත්නපුර | 17 | 46 | 575 | 15,962 |
| | එකතුව | **179** | **687** | **9098** | **252,576** |